www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සසප මැතිවරන උද්ඝෝෂනයේ අවසන් රැස්වීම

## Final public meeting for SEP election campaign in Sri Lanka

**2004 මාර්තු 25**

ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය (සසප) සිය මහ මැතිවරන උද්ඝෝෂනය සමාප්තියකට ගෙනඑමින්, මාර්තු 29 දා කොලඹ දී ප්‍රසිද්ධ රැස්වීමක් පවත්වයි. එරට මැතිවරන නීතිරීති යටතේ, සියලු ප්‍රසිද්ධ උද්ඝෝෂන ඡන්ද විමසීමට පැය 72කට පෙර නතර කල යුතු ය.

රැස්වීම සසප උද්ඝෝෂනයට පාදක වන දේශපාලන මූලධර්ම ද කම්කරු පන්තිය සඳහා එහි ඉදිරිදර්ශන ද පැහැදිලි කරනු ඇත. සසප ක්‍රියාමාර්ගයේ හරි මැද පවතින්නේ, ජාත්‍යන්තරවාදය සඳහා අරගලයයි. හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ සිය සහෝදර පක්ෂ සමග එක්ව, සසප සටන් වදින්නේ, ශ්‍රී ලංකාවේ වැඩ කරන ජනතාව ආසියාවේ, අප්‍රිකාවේ, ලතින් ඇමරිකාවේ සහ වැඩි දියුනු ධනපති රටවල සිටින ඔවුන්ගේ පන්ති සහෝදර සහෝදරියන් සමග ඒකාබද්ධ කරමින්, අධිරාජ්‍යවාදයට එරෙහිව භූගෝලීය ප්‍රතිප්‍රහාරයක් වර්ධනය කිරීමටයි.

දිවයිනේ උතුරෙන් හා නැගෙනහිරෙන් රජයේ සියලු හමුදාවන් වහාම හා කොන්දේසි විරහිතව ඉවත් කල යුතු යයි සසප ඉල්ලා සිටී. එමෙන් ම, පක්ෂය පැහැදිලි කර ඇත්තේ, ව්‍යසනකාරී 20 අවුරුදු සිවිල් යුද්ධය අවසන් කිරීමේ එකම සැබෑවින්ම ප්‍රගතිශීලී ක්‍රමය වන්නේ, ශ්‍රී ලංකා හා ඊලම් එක්සත් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා කම්කරු පන්තියේ හා ගම්බද ජනතාවගේ — සිංහල වේවා, දෙමල වේවා, මුස්ලිම් හෝ ක්‍රිස්තියානි වේවා — ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් වර්ධනය කිරීම බවයි.

පසුගිය සති ගනනාව තිස්සේ, සසප, ශ්‍රී ලංකාවේ හා ලෝක සිද්ධීන් පිලිබඳ *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* ප්‍රකාශවල හා ලිපිවල පිටපත් දස දහස් ගනනින් බෙදා හරිමින්, කම්හල්, කම්කරු නිවහන් ප්‍රදේශ හා විශ්වවිද්‍යාලවල උද්ඝෝෂනයේ යෙදී ඇත. කම්කරුවන්, තරුනයන් හා බුද්ධිමතුන් සිය ගනනක් සමග අපගේ විශ්ලේෂනය හා ඉදිරිදර්ශනය සාකච්ඡා කිරීමට, අපගේ සාමාජිකයෝ සමත්ව ඇත.

ප්‍රසිද්ධ රැස්වීමේ ප්‍රධාන කතිකයා වනු ඇත්තේ, *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජික, සසප ප්‍රධාන ලේකම් විජේ ඩයස් ය. කොලඹ දිස්ත්‍රික්කයට තරග වදින 23 දෙනෙකුගෙන් යුත් සසප අපේක්ෂක ලැයිස්තුවට නායකත්වය දෙන්නේ ද විජේ ඩයස් ය. සසප දේශපාලන කමිටු සාමාජික සහ අපේක්ෂක නන්ද වික්‍රමසිංහ රැස්වීමේ මුලසුන දරනු ඇත. ඉන්දියානු ට්‍රොට්ස්කිවාදී අරුන් කුමාර් ද සසප අපේක්ෂකයන් වන විලානි පීරිස්, එම්. දේවරාජා, පානිනී විජේසිරිවර්ධන, ප්‍රියදර්ශන මැද්දවත්ත සහ එස්.ටී. චන්ද්‍රසේකරන් ද රැස්වීමේ කතා කරනු ඇත.

ස්ථානය: **කොලඹ 2 ඉබ්බන්වල හන්දියේ හයිඩ් පිටිය**

වේලාව: **මාර්තු 29 සවස 4.00**

© www.wsws.org